022

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී උපාධි වැඩසටහන 2021/2022

5 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2022

SNU5239/ESU3139 - අධ්‍යාපනයේ නව ප්‍රවණතා

කාලය පැය තුනයි. (03)

---

දිනය - 2022.10.01 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

**1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## 1 වන කොටස

01. සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය මගින් පුද්ගලයන්ගේ සහ ජාතීන්ගේ මූලික සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් විස්තර කරයි. ඉන් එකක් (01) සඳහන් කරන්න.

02. විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුන්ගේ විභව කුසලතා සංවර්ධනය සඳහා අධ්‍යාපනයේ වැදගත්කම පැහැදිලි කරන්න.

03. 'මුළු ජීවිත කාලය තුළ ඉගෙනීම සිදු වන බැවින්, අධ්‍යාපනය විවිධ සන්දර්භයන් තුළ සිදු වේ.'

    දරුවෙකුගේ ජීවිත කාලය තුළ සිදුවන අධ්‍යාපන පද්ධති ආකාර තුනක් (03) සඳහන් කරන්න.

04. විශේෂ පාසල් පද්ධතියේ ප්‍රධාන අරමුණු දෙක (02) සඳහන් කරන්න.

05. සැමට අධ්‍යාපනය (EFA) පිළිබඳ ලෝක ප්‍රකාශය සහ මූලික ඉගෙනුම් අවශ්‍යතා සපුරාලීම සඳහා ක්‍රියාකාරී රාමුවක් තුළ (Jomtien Framework for action) රජයන් මගින් ක්‍රියාත්මක කළ හැකි ඉලක්ක මානයන් හයක් යෝජනා කළේය. ඒවායින් අවම වශයෙන් පහක් (05) සඳහන් කරන්න.

06. 'විශේෂ තත්ත්වයන් යටතේ ස්ථානගතකල දරුවන් 'යන යෙදුම නිදසුනක් සමග කෙටියෙන් පැහැදිලි කරන්න.

07. විශේෂ තත්ත්වයන් යටතේ ස්ථානගතකල දරුවන් පිළිබඳ 1989 - ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියේ සඳහන් වගන්ති මොනවා ද?

08. පාසල් පද්ධතිය තුළ අන්තර්කරණ අධ්‍යාපනය වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා රජයට ගත හැකි පියවර පහක් (05) සඳහන් කරන්න. (ලකුණු 05 x 08 = 40)

**THE OPEN UNIVERSITY OF SRI LANKA**

**FACULTY OF EDUCATION**

**DEGREE OF BACHELOR OF EDUCATION HONOURS IN SPECIAL NEEDS EDUCATION DEGREE PROGRAMME - 2021/2022**

**LEVEL - 05**

**FINAL EXAMINATION - 2022**

**SNU5239/ESU3139– EMERGING TRENDS IN EDUCATION**

**DURATION – THREE (03) HOURS**

Date: 01.10.2022 Time: 09.30 a.m. – 12.30 p.m.

**Answer All Questions in Part I and any three (03) questions from Part II.**

## PART - I

01. The International Convent in Civil and Political Rights details the basic civil and Political Rights of individuals and nations. State one of them.

02. Explain the importance of education for the Development of Potential Talents of students with special educational needs.

03. 'As learning takes place during the entire life span, education takes place in different contexts'

    State **three (03)** types of education system which takes place in a child's span.

04. State **two (02)** main purposes of the Special School System.

05. World Declaration Education for All (EFA) and a Framework of Action to meet basic learning needs (the Jomtien Frame work for Action) suggested six broad EFA target dimensions towards each governments could work. State at least **five (05)** of them.

06. Briefly explain the term 'Children Placed in Special Circumstances' with an example.

07. What are the articles of the United Nations Convention on the Rights of the Child - 1989 talk about Children Placed in Special Circumstances?

08. State **five (05)** steps that the Government of Sri Lanka can take to improve inclusive education in the school system.

(5 x 8 = 40 marks)

<u>2 වන කොටස</u>

09. ආ. "දුබලතා සහිත ළමුන් සඳහා ඒකීකරණ අධ්‍යාපනය" යන යෙදුම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

ආ. සමෝධානිත අන්තර්කරණය හා විශේෂ අධ්‍යාපනය අතර වෙනස කුමක්ද ? උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

ඇ. විශේෂ පාසල්, විශේෂ අධ්‍යාපන ඒකක සහ ශ්‍රී ලංකාවේ අන්තර්කරණ අධ්‍යාපන පද්ධති පිළිබඳව සාර්ථක භාවිතයන් සඳහා අදාළ සාධක සාකච්ඡා කරන්න. (ලකුණු 10)

10. අ. සහයෝගීතාව පිළිබඳ සංකල්පය සහ අන්තර්කරණ පන්තිකාමර සඳහා එහි අවශ්‍යතාවය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

ආ. සාමාන්‍ය සිසුන් විසින් විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුන් අවබෝධ කර ගැනීමට, ගරු කිරීමට සහ නිසි ලෙස ප්‍රතිචාර දැක්වීමට, උපකාර කිරීම සඳහා ගත හැකි පියවර කිහිපයක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

ඇ. සාමාන්‍ය අධ්‍යාපන ගුරුවරුන්ට සහ විශේෂ පුහුණු ගුරුවරුන්ට ඔවුන්ගේ පන්ති කාමරයේ විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුන්ගේ දෛනික අවශ්‍යතා සම්පූර්ණ කිරීමට සහාය විය හැකි ආකාරය උදාහරණ ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

11. අ. අවිධිමත් අධ්‍යාපන සංකල්පය උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

ආ. නොවිධිමත් අධ්‍යාපන සහ විධිමත් අධ්‍යාපන පද්ධති අතර වෙනස සන්සන්දනය කරන්න. (ලකුණු 06)

ඇ. IQ මට්ටම 60 - 69 සහිත බුද්ධිමය දුබලතා සහිත සිසුවෙකුගේ වෘත්තීය අධ්‍යාපනයේ නොවිධිමත් අධ්‍යාපන පද්ධතිය ස්ථාපනය කරන්නේ කෙසේ ද? (ලකුණු 09)

12. අ. ශ්‍රී ලංකාවේ විශේෂ අවශ්‍යතා සහිත ළමුන් සඳහා සමාන අධ්‍යාපන අවස්ථා පිළිබඳ නීතිමය විධිවිධාන පැහැදිලි කරන්න. (ලකුණු 05)

ආ. විසි එක්වන සියවයේ විශේෂ අධ්‍යාපන ක්ෂේත්‍රයේ දැකිය හැකි නව ප්‍රවණතා උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 06)

ඇ. විසිඑක්වන සියවසේ ශ්‍රී ලංකාවේ විශේෂ අධ්‍යාපයේ නව ප්‍රවණතා ක්‍රියාත්මක කිරීමේ දී විදුහල්පතිවරුන් සහ ගුරුවරුන් මුහුණ දෙන අභියෝග පැහැදිලි කරන්න. (ලකුණු 09)

## PART - II

09. a. Briefly explain the term "Integrated Education for Disabled Children".

(04 marks)

b. Explain citing examples what is the difference between inclusive, integrated and special education systems?

(06 marks)

c. Discuss relevant factors required for successful practices of Special Schools, Special Education Unites and the Inclusive Education system in Sri Lanka.

(10 marks)

10. a. Briefly explain the concept of collaboration and the need of it for inclusive classroom.

(05 marks)

b. Explain a few steps that could be done to help regular students understand, respect and respond appropriately to students with special educational needs.

(05 marks)

c. Explain citing examples how general education teachers and special trained teachers can support to fulfill the requirements on a day-to-day basis for students with special educational needs in their classroom.

(10 marks)

11. a. Explain by citing examples the concept of In-Formal Education.

(04 marks)

b. Compare the difference between non-formal education and formal education systems.

(06 marks)

c. How can you implement the non-formal education system in the career education of a students with an Intellectual Disability with and IQ level 60 – 69.

(10 marks)

13. අ. මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශයේ 26 වැනි වගන්තියේ සඳහන් පරිදි මානව අයිතීන් තහවුරු කිරීමේ දී අධ්‍යාපනයේ කාර්යභාරය පිළිබඳව නිර්වචනය කරන ආකාරය උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

ආ. විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති දරුවන්ගේ අධ්‍යාපනය සහතික කිරීම සඳහා පහත සම්මුතීන් විසින් පියවර ගෙන ඇති ආකාරය පිළිබඳ උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.

- ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය
- ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය
- කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කම් කිරීම් තුරන් කිරීම පිළිබඳ සම්මුතිය (ලකුණු 12)

14. අ. ශ්‍රී ලාංකීය සන්දර්භය තුළ ළමුන්ගේ විශේෂ තත්ත්වයන් ඇති වීම සඳහා හේතු වූ ව්‍යසනයන් පිළිබඳ උදාහරණ දක්වමින් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

ආ. ශ්‍රී ලංකාවේ COVID-19 වසංගත තත්ත්වය සහ ආර්ථික අර්බුදය, විශේෂ තත්ත්වයන් යටතේ ස්ථානගතකල දරුවන්ගේ අධ්‍යාපනයට කොතරම් දුරට බලපාන්නේ ද? (ලකුණු 07)

ඇ. ඉහත සඳහන් කල විශේෂ තත්ව යටතේ ස්ථානගතකල ළමුන්ගේ අධ්‍යාපනය දියුණු කිරීම සඳහා අවම වශයෙන් යෝජනා පහක් **(05)** දක්වන්න. (ලකුණු 07)

හිමිකම් ඇවිරිණි.

12. a. Explain legal provisions of equal educational opportunities for children with special needs in Sri Lanka.

(05 marks)

b. Explain with examples the new trends that can be seen in the filed of special education in the twenty-first century.

(06 marks)

c. Explain the challenges faced by principals and teachers in implementing the new trends of the twenty-first century in special education in Sri Lanka.

(09 marks)

13. a. Explain citing examples, how the Universal Declaration of Human Rights in Article 26 defines the role of education in ensuring human rights?

(08 marks)

b. Illustrate citing examples of how the following conventions have taken measures to ensure the education of children with special educational needs.

- International Covenant of Economic, Social and Cultural Rights.
- Convention on the Rights of the Child.
- Convention on the Elimination of All Forms of Discrimination against Women.

(14 marks)

14. a. Briefly explain citing examples of the disasters that were caused for creation of Children's special circumstances in the Sri Lankan context.

(06 marks)

b. To what extent to the COVIC-19 pandemic situation and economic crisis of Sri Lanka affect the education of the children placed in special circumstances?

(07 marks)

c. Give at least **five (05)** suggestions to improve the education to the children placed in special circumstances.

(07 marks)

*-Copyrights reserved-*